## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා අදාල වන දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය - 2018

බස්නාහිර පළාත් සෞඛ්‍ය සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වලට අදාළ පහත දක්වා ඇති තනතුරු සඳහා අදාල වන දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2018 වර්ෂය සඳහා පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

### 01. තනතුරු

| කාර්යාලය | තනතුරු |
|---|---|
| අමාත්‍යාංශය කාර්යාලය | කාර්යාල කාර්ය සහයක |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව (බ.ප) | කාර්යාල කාර්ය සහයක, මුරකරු |
| පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව (බ.ප) | කාර්යාල කාර්ය සහයක, මුරකරු |
| පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (බ.ප) | කාර්යාල කාර්ය සහයක, මුරකරු, සනීපාරක්ෂක කම්කරු |

### 02. සුදුසුකම්

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ (PL -01) තනතුරේ II ශ්‍රේණියේ මෙතෙක් මෙම පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ (PL -01) තනතුරේ I ශ්‍රේණියේ මෙතෙක් මෙම පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තවද අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2019.11.18 වන විට අදාල ශ්‍රේණියට පත්කර, අදාල පත්වීම් ලිපිය ලබා ඇති සේවක මහත්ම මහත්මීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.

### 03. අයදුම්පත්

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2019.11.18 දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය. ඒ සමග අදාළ ශ්‍රේණියට පත්කළ/ අන්තර්ග්‍රහණය කල ලිපියේ පිටපතක් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. ආදර්ශ අයදුම්පතෙහි ආකෘතිය අනුව, අයදුම්පත්‍රය එකම කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 07 දක්වාත් දෙවන පිටුවේ අංක 08 සිට 10 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.